**සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා සමාගම -2021/2022**

**-----------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා සමාගමේ ( ‘‘සමාගම’’) හා එහි පරිපාලිතයන් ඇතුළත් සමූහයෙහි (‘‘සමූහය’’) 2022 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත , 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1)ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී .පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ හා සමූහයෙහි මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී ජ'නල්වල සටහන් කල යුතු ගනුදෙනු පොදු ජ'නලයේ සහ අනෙකුත් ජ'නල්වල ගනුදෙනුවේ ස්වභාවය අනුව හඳුනාගෙන වෙන වෙනම සටහන් කිරීමටත් සියළුම ජ'නල් සටහන්හි සංලක්ෂ්‍යය ප්‍රමාණාත්මකව විස්තර කිරීමටත් කටයුතු කර නොතිබුණි. | ගිණුම්කරණ දෝෂ සහ වර්ගීකරණ දෝෂ නිවැරදි කිරීමට මෙය සිදු කිරීමට සිදු විය. | ජ'නල් සටහන් සඳහාවූ සංලක්ෂ්‍යය විස්තරාත්මකව දැක්විය යුතු වීම. |

### 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 79 (ආ) ඡේදය ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය අවසානයට සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණු නමුත් දැනටමත් භාවිතා කරන පිරිවැය රු. මිලියන 64.99 ක් වූ බොඩි ආමර් හා බැලැස්ටික් හෙල්මට්,කල්බදු වාහන සහ අනෙකුත් වාහන මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. | සම්පූර්ණයෙන්ම ක්ෂය වූ දේපල, පිරියත සහ උපකරණ මෙම මූල්‍ය වර්ෂයේදී නැවත ඇගයීමට ලක් කර නොමැති අතර 2022/2023 මූල්‍ය වර්ෂයේදී ඇගයීමට ලක් කරනු ලැබේ. කල් බදු වාහන කිසිවක් මේ වන විට නොමැති නමුත් කල්බදු කාලය අවසන් වූ බැවින් සියල්ල නිදහස් රඳවනය යටතේ ප්‍රාග්ධනීකරණය කර ඇති අතර අගයන්හි කිසිදු වෙනසක් සිදු නොවූ බැවින් සටහන් අංක 15 මගින් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතු වීම. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොඩබිම් මෙහෙයුම් අංශය මගින් ආරක්ෂක සේවාවන් සපයනු ලබන ආයතනවලින් 2021/2022 මූල්‍ය වර්ෂයට අදාළව අයවිය යුතු රු. මිලියන 2.23 ක් ණය අයකර ගැනීමේ අංශය පවත්වාගෙන යනු ලබන වාර්තා අනුව නිරවුල්කර තිබුණද, එම වටිනාකම අදාළ ණයගැති ගිණුම්වලට ගැලපීමට කටයුතු කර නොතිබීමෙන් ණයගැති ශේෂය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | මූලාශ්‍ර ලේඛන සහ මුල් පිටපත් සොයාගත යුතුව ඇති බව දැනුම් දී ඇත. | ශේෂයන් නිවැරදිව ගණනය කළ යුතු අතර ශේෂයන් අතර වෙනස්කම් සසඳා අවශ්‍ය ගැලපීම් කළ යුතු වීම. |
| (ආ) | සී/ස රක්නා ප්‍රොපර්ටි හෝල්ඩින් සමාගම වෙනුවෙන් වැටුප්, විදුලි හා ජල බිල්පත් වැනි සාමාන්‍ය මාසික මෙහෙයුම් වියදම් සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා සමාගම මගින් ගෙවීම් කිරීම සඳහා 151 වැනි අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබාදී තිබුණද, පරිපාලිත සමාගමේ සාමාන්‍ය මාසික මෙහෙයුම් වියදම්වලට නොගැනෙන රු. මිලියන 170.93 ක වියදම් සමාලෝචිත වර්ෂය තුළදී සමාගම මගින් දරා තිබුණි. | එම වියදම් 2022 මාර්තු දක්වා සිදු කරන ලද වියදම් වූ අතර 151 වැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම 2023 අප්‍රේල් මාසයේදී පවත්වන ලදි. | නිසි අනුමැතිය සහිත වියදම් පමණක් දැරිය යුතු වීම. |
| (ඇ) | 2021/2022 වර්ෂයේ ගොඩබිම් ආරක්ෂක අංශයේ රු. මිලියන 1,529 ක් වූ ආදායම තුළ ඇතුළත් රු. මිලියන 89.63 ක්වූ බැරපත් වටිනාකමෙන් 2019/2020 හා 2020/2021 ගිණුම් වර්ෂයන්ට අදාළව ආදායමට එරෙහිව ගලපන ලද බැරපත් වටිනාකම පිළිවෙලින් රු. මිලියන 0.7 ක් හා රු. මිලියන 6.46 ක් වීමෙන් සමාලෝචිත වර්ෂයේ ගොඩබිම් ආරක්ෂක ආදායම රු. මිලියන 7.16 ක් අඩුවෙන් ද, මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට පෙර හඳුනාගත් ගිණුම් වර්ෂය තුළදී ගැලපිය යුතු බැරපත් වටිනාකමට වූ රු.මිලියන 1.54 ක් සමාලෝචිත වර්ෂයට අදාල වන පරිදි ගලපා නොතිබීම හේතුවෙන් ආදායම වැඩියෙන් ද දක්වා තිබුණි. | ආදායම් ලබාගැනීමට ඉදිරිපත් කරන ඉන්වොයිස් සඳහා අදාළ ආයතනයන් විසින් නිරවුල් කළ යුතු වටිනාකම වෙනස්වන අවස්ථා වලදී ඒ වෙනුවෙන් තහවුරු කිරීම් ලබාගත් පසුව නිවැරදි කිරීමට ණය සටහන් පත් නිකුත් කරන අතර බොහෝ විට එම ඉන්වොයිස් එකම මාසයට අදාළ නොවේ. පසුකාලීනව ණය සටහන් පත් අදාළ මාසයන්ට අනුව නිකුත් කරණු ලබන්නේ නම්, වැට් බදු ප්‍රතිලාභ සංශෝධනය කළ යුතු වන අතර වැට් බදු ගෙවීම්/ආපසු ගෙවීම සඳහා ගැටලු රාශියක් මතුවිය හැකි බැවින් මෙම ක්‍රියාවලිය වෘත්තීය උපක්‍රමයක් ලෙස අනුගමනය කර ඇත. | සමාලෝචිත වර්ෂයට අදාල ආදායම නිවැරදිව හඳුනා ගෙන මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් සිදුකළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දක්වා තිබුණු විලම්භිත බදු, වෙනත් ගෙවිය යුතු ශේෂය සහ විශ්‍රාම ප්‍රතිලාභ මත බැදියාව රු. මිලියන 172.48 ක් වුවද එය මූල්‍ය ප්‍රකාශන සටහන්වලට රු. මිලියන 152.79 ක් ලෙස ගෙන තිබීමෙන් එම ගිණුම්වලට අදාල වටිනාකම රු. මිලියන 19.69 ක් අඩුවෙන් ගිණුම්කරණ සටහන් හි පෙන්නුම් කර තිබුණි. | ලේඛනවල කෙටුම්පත් දෝෂයක් හේතුවෙන් සංශෝධනය කරන ලද අතර එමගින් ශේෂ පත්‍රයේ වෙනසක් සිදු නොවන බැවින් අදාළ සටහන් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකළ යුතු වීම. |
| (ඉ) | දේශීය ස්ථාවර තැන්පතු, සමුද්‍රීය අංශයේ ස්ථාවර තැන්පතු සහ භාණ්ඩාගාර බිල්පත් හි උපලේඛණ අනුව සමාලෝචිත වර්ෂයට අදාල රු. මිලියන 25.27 ක් වූ පොළී ආදායම රු.මිලියන 32.74 ක් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් පොළී ආදායම රු. මිලියන 7.47 ක් වැඩියෙන් ගිණුම්ගත වී තිබුණි. | වෙනත් ආදායම් වැරදි ලෙස පොලී ආදායමට සම්බන්ධ කර ඇති අතර එය වෙනත් ආදායම් යටතේ වර්ග කළ යුතුය. | ශේෂයන් නිවැරදිව ගණනය කළ යුතු අතර ශේෂයන් අතර වෙනස්කම් සසඳා අවශ්‍ය ගැලපීම් කළ යුතු වීම. |
| (ඊ) | ඒකාබද්ධ ව්‍යාපාරයක් සඳහා ආරක්ෂක මෙහෙයුම් සිදු කිරීම හා ධිවර යාත්‍රාවල ආරක්ෂාව සඳහා සී මාෂල්වරුන් යෙදවීම සම්බන්ධයෙන් සී/ස ඇවන්ගාඞ් මෙරිටයිම් සර්විසස් (පුද්ගලික) සමාගම සමග ඇතිකරගත් ඒකාබද්ධ ගිවිසුම් ප්‍රකාරව උපයන මෙහෙයුම් ආදායමෙන් පිළිවෙලින් මසකට සියයට 05ක් හා සියයට 07 ක් බැගින් සී/ස රක්නා ආරක්ෂක ලංකා සමාගම වෙත ගෙවිය යුතු ආදායම් මුදල් පදනම මත ගිණුම්ගත කර තිබුණි. | ඒකාබද්ධ ව්‍යාපාරයක් සඳහා ආරක්ෂක මෙහෙයුම් (OBST) රිසිට්පත් (5%) සහ ධීවර යාත්‍රාවල ආරක්ෂාව සඳහා සී මාර්ෂල්වරුන් යෙදවීමට අදාළ මෙහෙයුම් රිසිට්පත් (7%) එහි ක්‍රියාකාරිත්වයේ ස්වභාවය අනුව මුදල් පදනමින් සටහන් කර ඇත. | සමාලෝචිත වර්ෂයට අදාළ ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කිරීම් සිදුකළ යුතුය. |
| (උ) | වාණිජ කාර්යාල සංකීර්ණ ගොඩනැගිල්ල ඉදිකිරීම කර තිබූ ඉඩම සඳහා ගෙවන ලද රු.මිලියන 12.4 ක් වූ වැට්බදු නැවත අයකර ගැනීමේ හැකියාවක් නොමැති වුවත් එම වටිනාකම කලින් ගෙවීම් හා අනෙකුත් වෙළඳ ලැබීම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් වැට් බදු ආපසු ගෙවීමේ දැන්වීම ලබා ගත හැකි බැවින් සහ ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ප්‍රතිදාන බද්ද බොහෝ විට ආරම්භයේදීම නොලැබෙන හෙයින් මෙය ලැබිය යුතු යටතේ සටහන් කර ඇත. | අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකර ගිණුම් වාර්තා සැකසිය යුතු වීම. |

### 1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | | |
| T – 56 වර්ගයේ සහ LMG වර්ගයේ ආයුධ වටිනාකම | 31.90 | 11.62 | 20.28 | 2022/2023 මූල්‍ය වර්ෂයේදී අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකරනු ලැබේ. | ශේෂයන් අතර වෙනස්කම් සසඳා අවශ්‍ය ගැලපීම් කළ යුතුවීම. |
| නිළ ඇඳුම් වටිනාකම | 12.93 | 13.33 | 0.4 | 2022/2023 මූල්‍ය වර්ෂයේදී අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකරනු ලැබේ. | ශේෂයන් අතර වෙනස්කම් සසඳා අවශ්‍ය ගැලපීම් කළ යුතුවීම. |
| පතරොම් තොගය | 29.12 | 10.55 | 18.57 | 2022/2023 මූල්‍ය වර්ෂයේදී අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකරනු ලැබේ. | ශේෂයන් අතර වෙනස්කම් සසඳා අවශ්‍ය ගැලපීම් කළ යුතුවීම. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු. මිලියන 126.53 ක්වූ වෙනත් ලැබිය යුතු ගිණුම් ශේෂය තුළ රු. මිලියන 36.53 ක ශේෂ ගැලපුම් නමින් වූ ගිණුමක් පැවති අතර එය සමාලෝචිත වර්ෂය අවසානය තෙක් නිරවුල් කර නොතිබුණි. | අවශ්‍ය නිවැරදි කිරීම් 2022/2023 මූල්‍ය වර්ෂයේදී, පෙර වසරේ ගැලපුම් ලෙස සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | ගැලපුම් ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට සමාගමේ රු. මිලියන 583.81 ක් වූ වෙළඳ ලැබිය යුතු ශේෂයෙන් ගොඩබිම් අංශයේ රු. මිලියන 6.11 ක් හා සමුද්‍රීය අංශයේ රු.මිලියන 1.20 ක් වශයෙන් එකතුව රු. මිලියන 7.31 ක ණයගැති සෘණ ශේෂ පැවති අතර ඒවා නිරවුල් කිරීමට අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබුණි. | මෙය විශේෂිත සේවාදායකයකුගේ ශේෂයේ වර්ගීකරණ ගැටළුවක් පමණක් වන අතර වෙළඳ ණයගැතියන්ගේ සමස්ත ශේෂයට බලපෑමක් සිදුවී නොමැත. වර්ගීකරණ ගැටළුද නිවැරදි කිරීමට පියවර ගෙන ඇත. | හඳුනාගත් සෘණ ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය ගැලපීම් සිදුකළ යුතුවීම. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට සමාගමේ රු. මිලියන 696.16 ක් වූ ලැබිය යුතු ගිණුම් වලින් ගිණුම් 65 කට අදාලව වර්ෂ 05 කට වැඩි කාලයක සිට ලැබිය යුතු රු. මිලියන 79.82 ක් ද ගිණුම් 47 කට අදාලව වර්ෂ 01 ත් 05 ත් අතර ලැබිය යුතු රු. මිලියන 18.05 ක්ද වූ | ගිණුම්කරණ ප්‍රතිපත්තිය දැනටමත් වෙනස් කර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇති අතර එය 2024 ජනවාරි සිට ක්‍රියාත්මක වේ. | ලැබිය යුතු ගිණුම්හි කාල විශ්ලේෂණය සැලකිල්ලට ගෙන ණය ශේෂයන් අයකරගැනීමට කටයුතු කළ යුතු වීම. |

අතර ලැබිය යුතු ගිණුම් හි කාල විශ්ලේෂණය සැලකිල්ලට ගැනීමකින් තොරව සමස්ථ ලැබිය යුතු ගිණුම් ශේෂයන් සියයට 05 ක් ප්‍රමාණයක් ලෙස අඩමාන ණය වෙන් කිරීමට කටයුතු කර තිබුණි.

**1.6.2 ගෙවිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙළඳ ණයහිමි ශේෂය තුළ ණයහිමියන් 27 දෙනෙකුට අදාළව රු. මිලියන 2.51 ක සෘණ ශේෂ පැවති අතර ඒවා නිරවුල් කිරීමට අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබුණි. | මෙය ශේෂ වර්ගීකරණ ගැටළුවක් පමණක් වන අතර වෙළඳ ණයහිමියන්ගේ සමස්ත ශේෂයට බලපෑමක් සිදුවී නොමැති බැවින් වර්ගීකරණ ගැටළුද නිවැරදි කිරීමට පියවර ගෙන ඇත. | ගෙවිය යුතු සෘණ ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය ගැලපීම් සිදුකළ යුතුවීම. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2002 අංක 14 දරන එකතු කල අගය මත බදු පනතේ 26 (1) වගන්තිය | යම් බදු අය කළ හැකි කාලසීමාවක් සම්බන්ධයෙන් වූ බද්ද, ඒ බදු අයකල හැකි කාලසීමාව අවසාන වීමෙන් පසුව එළඹෙන මාසයේ අවසාන දිනට පසු දිනයක් නොවන දිනයක ගෙවිය යුතුය. නමුත් මෙම වාර්තාවේ දිනය වන විට රු. මිලියන 79.11 ක් ගෙවිය යුතුව පැවතුණි. | 2022 ජූනි දක්වා සම්පූර්ණ වගකීම (අභියාචනා සහ විරෝධතාවලට යටත්ව) රු. 101,612,346 ක් වූ අතර ගෙවීම් සැලැස්මට අනුව පියවීම් (2024 ජනවාරි සිට අප්‍රේල් දක්වා) රු. 22,500,000 ක් වූ බැවින් 2024 අප්‍රේල් 30 දිනට නියමිත ශේෂය රු. 79,112,346 කි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| | (i) 2.7, 2.8 සහ 3.2 වගන්ති සහ 2011 ජනවාරි 01 නිකුත් කළ ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්තික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන අත්පොත සඳහා වූ 20 වන අතිරේකය | ඉදිකිරීම් ඇස්තමේන්තු වටිනාකම රු. මිලියන 3,192.47 ක් වූ සමාගමේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව සඳහා මාර්ගෝපදේශ ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටුවක් හා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කර නොතිබුණි. එසේම , 20 වන අතිරේකය | 2015 වසරේ අතරමඟ නවතා දැමූ මෙම ව්‍යාපෘතිය 2020 වසරේ මිශ්‍ර සංවර්ධන වාණිජ කාර්යාල සංකීර්ණ ව්‍යාපෘතියක් ලෙස සංශෝධනයකර නැවත ඉදිකිරීම් කටයුතු සහ උපදේශන සේවා වෙනුවෙන් කොන්ත්‍රාත් සමාගම සහ උපදේශන සමාගම වෙත පැවරීම සඳහා එවකට සිටි සභාපති ඇතුළු | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය නොකිරීම පිළිබඳව කළමනාකාරීත්වයේ වගකීම යොමුවිය යුතු වීම. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | ප්‍රකාරව රු.මිලියන 150 ට වැඩි කොන්ත්‍රාත් සඳහා අමාත්‍ය මණ්ඩලය පත්කල ප්‍රසම්පාදන කමිටුවක් මඟින් කොන්ත්‍රාත්කරු තෝරා ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කල යුතු වුවද, උක්ත ගොඩනැගිලි ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත් සමාගම තෝරා ගැනීමේ දී එපරිදි කටයුතු කර නොතිබුණි. තරඟකාරී ලංසුකරුවන්ගෙන් මිල ගණන් කැඳවීමකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩලයේ ඒකමතික තීරණය මත ඉදිකිරීම් කොන්ත්‍රාත් සමාගම තෝරාගෙන තිබුණි. | කළමනාකාරිත්වය ප්‍රසම්පාදන කමිටුවක් සහ තාක්ෂණ ඇගයීම් කමිටුවක් පත්කර නොතිබුණු අතර හිටපු සභාපති/ප්‍රවීනි ඇතුළු කළමනාකාරිත්වය සිය අභිමතය පරිදි කටයුතු කර ඇත. | |
| | (ii) | 2007 නොවැම්බර් මස නිකුත් කළ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උපදේශක සේවා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොතේ 2.10.1 වගන්තිය සහ 3 පරිච්ඡේදය | රු.මිලියන 100 හෝ ඊට වැඩි වටිනාකමකට උපදේශක සමාගමක් තෝරා ගැනීමේ දී අමාත්‍ය මණ්ඩලය පත්කල ප්‍රසම්පාදන කමිටුවක් මඟින් සිදුකල යුතු වුවද, රක්නා ආරක්ෂක ලංකා සමාගමේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම් ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 182.43 ක වටිනාකමකට උපදේශක සමාගම තෝරා ගැනීමේදී එකී විධිවිධාන අනුව කටයුතු නොකර සමාගම විසින් උපදේශක සමාගම තෝරාගෙන තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත් පොතේ 2.10.1 වගන්තිය ප්‍රකාරව කටයුතුකර නොමැති අතර උපදේශක සමාගම වෙත උපදේශන සේවා සැපයීම වෙනුවෙන් කොන්ත්‍රාත්තුව අනුමතකළ ලියකියවිලි කිසිවක් දැනට සමාගම සන්තකයේ නොමැත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය නොකිරීම පිළිබඳව කළමනාකාරීත්වයේ වගකීම යොමුවිය යුතු වීම. |
| (ඇ) | | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 395 (ඇ) | එක් එක් මාසය අවසානයේ දී ඇති ගනුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊලග මාසයේ 15 වැනි දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශයන් පිළියෙල කල යුතු වුවත්, සමාගම විසින් පවත්වාගෙන යනු ලබන බැංකු ගිණුම් 05 ක් සඳහා 2023 සැප්තැම්බර් මාසය වන විට මාස 05 ත් 16ත් අතර කාල පරාසයක සිට බැංකු සැසඳුම් ප්‍රකාශයන් පිළියෙල කර නොතිබුණි. | මෙම නිරීක්ෂණය සමඟ එකඟ වන අතර 2023 සැප්තැම්බර් මාසය දක්වාවූ මෙම සියලුම බැංකු සැසඳුම් ප්‍රකාශන 2023.11.10 දින ආරක්ෂක අමාත්‍යාංශය සහ ජාතික විගණන කාර්යාලය වෙත යොමුකර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

(ඇ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ

(i) අංක 01/2021 දරන 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සහ එයට අදාල මෙහෙයුම් අත්පොත

| | | | |
|---|---|---|---|
| 3.4 (i) වගන්තිය | 2022 මාර්තු 31 දිනට සමාගමේ බඳවා ගැනීමේ පටිපාටියක් නොතිබූ නමුත් එක් එක් තනතුරු වලට අදාල සේවක සංඛ්‍යාව, වැටුප් පරිමාණය, ගිණුම් අංශයේ අදාළ තනතුරුවලට රැකියා විස්තරයන්, පත්වීමේ ස්වභාවය, වයස් සීමාවන්, බඳවා ගන්නා ආකාරයන් (බාහිර හා අභ්‍යන්තර දැනුම්දීම් / ලිඛිත තක්සේරුව/ සම්මුඛ පරීක්ෂණ ආදි වශයෙන්) 2023 මැයි 30 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණයෙන් අනුමත කරන ලද බඳවා ගැනීමේ පටිපාටිය තුල අන්තර්ගත වී නොතිබුණි. | 152 වැනි අධ්‍යක්ෂ මණ්ඩළ රැස්වීමේදී සමාගමේ එක් එක් තනතුරු සඳහා බඳවාගැනීමේ ක්‍රියා පටිපාටිය (SOR) අප ආයතනයේ ව්‍යාපාරික ක්‍රමවේදයට සරිලන ආකාරයට සිදු කිරීම සඳහා අනුමත කරගන්නා ලදි. තවද එක් එක් තනතුරු වලට අදාළ රැකියා විස්තරය ව්‍යාපාරික අවශ්‍යතාවයන් අනුව තනතුරෙන් තනතුරට වෙනස්වන ආකාරයට සකසා කාර්ය මණ්ඩලයේ සියලුම අයවළුන් හට ලබාදී ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව අවශ්‍ය සංශෝධන සිදුකළ යුතුවීම. |
| 6.6 වගන්තිය | සමාගම විසින් ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2021/2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වර්ෂ 01 මාස 06 ක ප්‍රමාදයක් සහිතව 2023 දෙසැම්බර් මස 08 වන දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණු අතර වර්ෂය සඳහා වූ කෙටුම්පත් වාර්ෂික වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමග විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018/2019, 2019/2020 සහ 2020/2021 යන මූල්‍ය වර්ෂයන්ට අදාළ මූල්‍ය ප්‍රකාශන නියමිත කාලවකවානු ඇතුළත සකස්කර විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් ඊට පසු සිදුකළ යුතු ඉදිරි සියලු ක්‍රියාදාමයන් ප්‍රමාදවීම වලක්වා ගැනීමට නොහැකිවීම මත 2021/2022 මූල්‍ය ප්‍රකාශනද අපේක්ෂිත දිනට ප්‍රථම විගණනය සඳහා ඉදිරිපත් කිරීමට නොහැකිවී ඇත. මෙම තත්වය 2024/2025 මූල්‍ය වර්ෂයේදී වළක්වා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ. | නීති රීති හා රෙගුලාසිවලට අනුව නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුවීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | අංක 02/2022 දරන 2022 ජනවාරි 18 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| | 02 සහ 06 වගන්තිය. | 2022 මාර්තු මස සිට නියැදි පරීක්ෂාවට ලක් කරන ලද කොන්ත්‍රාත් පදනම මත සේවය කරන කළමණාකරන මට්ටමේ නිලධාරීන් 20 දෙනෙකුට කෝපරේට් දුරකතන පැකේජ් සේවාව ලබා ගැනීම සඳහා වූ ගිවිසුම් ප්‍රකාරව රු. 102,000 ක දුරකථන බිල්පත් සමාගම විසින් ගෙවා තිබියදී එම නිලධාරීන් වෙනුවෙන් රු.117,000 ක දුරකථන දීමනා චක්‍රලේඛ සීමාවන් සැලකිල්ලට නොගෙන වැටුපට එකතුකර ගෙවා තිබුණි. | සමාගමේ ව්‍යාපාරික ස්වභාවය මත සන්නිවේදන පහසුකම් ලබාදීමට කටයුතු කළ අතර මේ වන විට zoom තාක්ෂණය වැනි නවීන ක්‍රමවේදයන් ඔස්සේ සන්නිවේදන කටයුතු සිදුකරන බැවින් කෝපරේට් පැකේජය පමණක් ප්‍රමණවත් නොවන අවස්ථා පවතී. රාජකාරී අවශ්‍යතාවයන් වෙනුවෙන් සමාගම විසින් කිසිදු ගෙවීමක් නොකර තම දායකත්වය ලබාදෙන ලෙසට නිලධාරීන් වෙතින් ඉල්ලා සිටීම වගකිව යුතු සමාගමක් වශයෙන් සාධාරණ නොවන බැවින් මෙම ගෙවීම් ආයතනය විසින් සිදුකරනු ලබන ආයෝජනයක් බව වැඩිදුරටත් දන්වමි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (iii) | අංක 06/2022 දරන 2022 ඔක්තෝම්බර් 06 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ I හා IV වගන්තිය. | කිසියම් නිලධාරියකුගේ අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 60 වන අතර එම චක්‍රලේඛයේ IV වගන්තිය ප්‍රකාරව, වයස අවුරුදු 60 ඉක්මවා දැනට සේවයේ යෙදී සිටින සහ 2022 දෙසැම්බර් 31 දින හෝ එදිනට පෙර වයස අවුරුදු 60 සම්පූර්ණ වන රාජ්‍ය සතු ව්‍යවසායන්හි සේවකයන් 2022 දෙසැම්බර් 31 දිනට හෝ ඊට ප්‍රථම අනිවාර්යෙන්ම විශ්‍රාම ගතයුතු වුවත් වයස අවුරුදු 60 ඉක්මවූ කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු 10 දෙනෙකු 2022 මාර්තු 31 දිනට සේවයේ නිරතව තිබුණි. | සමාගමේ ව්‍යාපාරික අවශ්‍යතාවය මත වයස අවුරුදු 65 දක්වා කොන්ත්‍රාත් පදනම මත වාර්ෂිකව සේවයේ දීර්ඝ කිරීම සමාගම් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව සිදුකෙරේ. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් සමඟ 2024.01.30 දින පැවති සකාච්ඡාවකදී වාචික එකඟතාවයකට පැමිණි අතර මේ සම්බන්ධයෙන් ලිඛිත ඉල්ලීමක් සිදුකරන ලෙස උපදෙස් ලබාදෙන ලදි. එම ලිඛිත ඉල්ලීම සඳහා පිළිතුරු මේ දක්වා ලැබී නොමැත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.204,005,998 ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. 132,062,915 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 71,943,083 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ආදායමේ දේශීය අංශය රු.369,553,958 කින් වර්ධනය වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ විධායක සහ කාර්යමණ්ඩල වැටුප් වියදම් පිළිවෙලින් රු.108,972,586 ක් හා රු.143,543,877 ක්වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ එම වියදම සියයට 32 කින් වැඩිවී තිබුණි. එමෙන්ම, ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය පිරිවැය පිළිවෙලින් රු. 24,608,998 ක් හා රු.94,058,649 ක් වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ එම වියදම සියයට 282 කින් වැඩිවී තිබුණි. තවද, ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ ගමන් හා ප්‍රවාහන වියදම් පිළිවෙලින් රු. 1,739,636 ක් හා රු.5,319,107 ක්වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ එම වියදම සියයට 206 කින් වැඩිවී තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් අනුපාතය පිළිවෙලින් 3.12 ක් හා 3.23 ක් වී තිබුණු අතර ක්ෂණික වත්කම් අනුපාතය පිළිවෙලින් 3.12 ක් 3.23 ක් වී තිබුණි. සමාගමේ මෙහෙයුම් කටයුතු කාර්යක්ෂමව සිදුකිරීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමුවිය යුතුව පැවතුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සුහසාධක සංගමය විසින් පවත්වාගෙන යනු ලබන වෙළඳසැලට අනුයුක්ත කාර්ය මණ්ඩලය වෙනුවෙන් 2022 පෙබරවාරි සිට ජූලි මාසය දක්වා රු. මිලියන 4.57 ක වැටුප් ගෙවා තිබුණි. එම කාලපරිච්ඡේදය තුළ වෙළඳසැලෙහි ශුද්ධ අලාභය රු. මිලියන 8.72 ක් වූ බැවින් හා වෙළඳසැල දිගින් දිගටම අලාභ ලැබීම මත 2022 සැප්තැම්බර් මස වසා දමා තිබුණු අතර සුහසාධක සංගමය වෙත සමාගම ලබා දී තිබූ පොලී රහිත ණය මුදලෙන් තවදුරටත් රු.මිලියන 1.28 ක් අයකරගත යුතුව තිබුණි. | වෙළඳසැල ආරම්භ කිරීමට ප්‍රථම ශක්‍යතා අධ්‍යයන වාර්තා පිළියෙල කිරීමකින් තොරව එවකට සිටි සභාපති ඇතුළු කළමනාකාරිත්වය මෙම වෙළඳසැල ආරම්භකර පවත්වාගෙන යාමට කටයුතුකර ඇති අතර 2022 ජනවාරි සිට 2022 සැප්තැම්බර් දක්වා කාලසීමාව තුළ සුහසාධක සංගමයේ Hello Fresh ගිණුමේ රු. 8,716,861 ශුද්ධ අලාභයක් ලබා ඇත. 2022.08.11 දින වත්මන් සභාපති/ප්‍රධාන විධායක නිලධාරි ලෙස රාජකාරි භාර ගැනීමෙන් පසු මෙම සුහසාධක වෙළඳසැල් ගිණුමේ කටයුතු සබැඳිව ගැටළුකාරි තත්වයක් නිරීක්ෂණයවූ බැවින්, ආරක්ෂක ලේකම් දැනුවත්කර ආරක්ෂක අමාත්‍යාංශය මට්ටමින් සිදුකළ විගණනයට අනුව එම කාලසීමාව තුළ රු. මිලියන 12.2ක අලාභයක් සිදුව ඇති බවත්, විගණනයට භාජනයකළ මාස 06 තුළ එක් මාසයකට රු. මිලියන 2ක පමණ අලාභයක් පවතින බව පෙන්වා දෙමින් මෙම වෙළඳසැලෙන් අපේක්ෂිත ප්‍රථිපල නොලැබෙන බවට එකී විගණන වාර්තාව මගින් පෙන්වාදී ඇත. ඒ අනුව 2022 සැප්තැම්බර් මස වෙළඳ සැල වසා දැමීමට කටයුතු කරන ලදි.<br>සුභ සාධක සහ මරණාධාර සංගමයන් වෙත සමාගමේ කාර්ය මණ්ඩලය ස්වේච්ඡාවෙන් සාමාජිකත්වය ලබාගන්නා අතර එම සංගම්වල පරිපාලන, මූල්‍ය හා මෙහෙයුම් කටයුතු සිදු කිරීම එහි වගකීම කිසි ලෙසකින් සමාගම සතු නොවන අතර එම සංගමයන් විසින් නිල බලයෙන් පත්කරන ලද නිලධාරීන් විසින් සිදු කරනු ලැබේ. | ණය ශේෂ අයකරගැනීමට කටයුතු කළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දේශීය නාවික නියෝජිත ආයතනයන් වෙත 2011 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා නිකුත් කරන ලද, රඳවා ඇති ස්ථානයන් නිශ්චිත නොවූ අවි ආයුධ 13 ක් සහ විදේශීය අවි ගබඩා 08 ක රඳවා තිබූ අවි ආයුධ 139 ක් නැවත ලබාගැනීමට හෝ ඒවා ගෙන්වා ගැනීම හෝ ගෙන්වා ගැනීමේදී පිරිවැය ඵලදායී නොවන්නේ නම් වෙනත් විකල්ප ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, සමාගම විසින් දේශීය නාවික නියෝජිතයන් වෙත නිකුත් කරනලද අවි ආයුධ 67 ක්, උපාංග 307 ක් හා පතරොම් 5008 ක් 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වාවූ කාලය තුළ සමුද්‍රීය ආරක්ෂක සමාගම් විසින් මුහුදු බත්කර තිබුණු අතර මුහුදු බත් කිරීමට අදාළ ක්‍රමවේදයන් අනුමත කරගැනීමට සහ ඒ සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීම ඇතුළු පිළිගත් ක්‍රමවේදයන් හඳුනාගෙන නොතිබුණි. මුහුදු බත් කළ අවි ආයුධ 67 න් 56 කට අදාළ රු. මිලියන 8.81 ක් වූ අලාභයෙන් රු. 528,000 ක් අයකිරීමටත් ඉතිරි අවි ආයුධ 11ට අදාල අලාභ අයකර ගැනීමටත් සහ එම අවි ආයුධ සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමත් මෙම වාර්තාවේ දිනය දක්වා සිදුව නොතිබුණි. | නිකුත්කර ඇති අවි 139 සහ රඳවාගෙන ඇති ස්ථාන සම්බන්ධ තොරතුරු නොමැති අවි 13 සම්බන්ධයෙන් අප සමාගම විසින් වරින්වර අදාළ නාවික ආයතන දැනුවත්කර එම අවි සමාගම වෙත ගෙන්වා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇතත් ඒ සම්බන්ධයෙන් යහපත් ප්‍රතිචාරයක් ලැබී නොමැති අතර මේ සබැඳිව ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකුගේ සභාපතිත්වයෙන් යුතුව මණ්ඩලයක් පත්කර ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු සිදුකරනු ලැබේ. එම අවි හා උපකරණ මෙරටට ගෙන්වා ගැනීමට හෝ ඒ සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදු වන්නේ නම් නියමිත ක්‍රමවේදයට අනුව විනාශ කර සනාථ කරගැනීමට අවැසි කටයුතු නිරන්තරයෙන් සිදු කරණු ලැබේ.<br>අවි 67 හා උපකරණ , නෞකාවන් වෙත නිකුත් කිරීමෙන් පසු විවිධ හේතුන් මත එම නෞකාවන්හී කපිතාන්වරු හට පවරා ඇති බලතල අනුව මුහුදුබත් කිරීමට කටයුතුකර ඇත. මුහුදුබත් කර ඇති අවි 67 සම්බන්ධව නැවත 2023.12.06 දිනැති අංක: RALL/MD/ARMOURY/08/ 2023(553) දරන ලිපිය මගින් ආරක්ෂක අමාත්‍යාංශය දැනුවත් කිරීමට කටයුතු කර ඇත. මුහුදුබත් කර ඇති මෙම අවි 67 අතුරින් අවි 56ක් සහ උපකරණවල වටිනාකම අයකර ගැනීමට කටයුතු කරන ලෙස අප ගිණුම් අංශය වෙත ලිඛිතව දැනුම්දී ඇත. ඉතිරි අවි 11 සම්බන්ධයෙන් අදාළ නාවික සමාගම් විසින් ප්‍රමාණවත් ලිඛිත සාක්ෂි ඉදිරිපත්කර නොමැති බැවින් එම සමාගම් වෙතින් අවි මුහුදු බත් කිරීමට අදාළ ප්‍රමාණවත් සාක්ෂි ලබාගැනීමට අප සමාගම විසින් කටයුතු කරමින් පවති. | අවි ආයුධ නැවත ගෙන්වා ගැනීමට හෝ වෙනත් විකල්ප ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතු අතර අලාභයන් අයකරගැනීමට හා රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | දුරකථන සමාගමකින් ලබාගන්නා ලද එකක වටිනාකම රු.307,500 ක් වූ Apple iPhone 13128GB midnight වර්ගයේ ජංගම දුරකථන 5 න් එක් ජංගම දුරකථනයක් ලබා ගන්නා ලද නිලධාරියා සමාගමෙන් ඉවත්වී ඇති නමුත් සමාගමට භාරදී නොතිබුණද ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් සමාගම | මෙම දුරකථන Mobitel (Private) Limited සමාගම විසින් FOC (Free of Charge) පදනම යටතේ එවකට සිටි අධ්‍යක්ෂ - ආයතනික සබඳතා, මානව සම්පත් හා පාලන ලෙස කටයුතු කරන ලද ලුතිනන් කර්නල් ඒ.ටී බානගොඩ (විශ්‍රාමික) වෙත ලබාදී තිබුණු අතර මේ සම්බන්ධයෙන් ඒ.ටී බානගොඩ (විශ්‍රාමික) මහතාගෙන් විමසුවිට දුරකථන 04 ක් ලබාදෙන ලද නිලධාරීන්ගේ නම් අප වෙත දැනුම්දුන් නමුත් අනෙක් දුරකථනය භාරදුන් අය කවුරුන්ද යන්න මතක නොමැති බව සඳහන් කරන ලදි. කෙසේ වුවද මෙම | වත්කම් නැවත ලබාගැනීමට සමාගම කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | විසින් මේ දක්වා ගෙන නොතිබුණි. | දුරකථන සම්බන්ධයෙන් සමාගම කිසිදු ආකාරයකින් මුදල් ගෙවා නොමැත. | |
| (ඈ) | රක්නා ආරක්ෂක ලංකා සමාගමේ අරමුණු හා කාර්යය භාරය යටතට නොගැනෙන කාබනික පොහොර නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව රක්නා ප්‍රොජෙක්ට් මැනේජ්මන්ට් (RPML) සමාගම 2021 ජුනි 21 දින පිහිටුවා තිබුණි. මෙම සමාගම පිහිටුවීමේ අවශ්‍යතාවයක් පවතින්නේද යන්න පිළිබඳව ශක්‍යතා අධ්‍යනයක් කළ යුතු බවට හා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගත යුතු බව ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් 2021 ඔක්තෝම්බර් මස දන්වා තිබුණද, ශක්‍යතා අධ්‍යනයක් සිදු කිරීමෙන් හෝ භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමකින් තොරව මෙම පරිපාලිත සමාගම පිහිටුවා තිබුණි. | සී/ස රක්නා ආරක්ෂක ලංකා සමාගම නව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අරමුණින් රක්නා ප්‍රොජෙක්ට් මැනේජ්මන්ට් ලිමිටඩ් (RPML) නමින් උප සමාගමක් පිහිටුවීම සඳහා පහත සඳහන් අනුමැතින් ලබාගැනීම එවකට සිටි කළමනාකාරිත්වය කටයුතු කර ඇති බව පවත්නා ලේඛන මත තහවුරුවී ඇත. 2021.05.27 දිනැති අංක: RALL/SEC/LEGAL/MOD/2021(16) දරන ලිපිය ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමු කරමින් නව උප සමාගම පිහිටුවීම සඳහා අනුමැතිය ඉල්ලා ඇත. ඉහත සඳහන් ලිපියට උපදෙස් ලබාදෙමින් 2021.06.01 දිනැති අංක : SMONS/NS/RALL/SUBSIDIARY/2021(01) දරන රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශ ලිපිය මගින් මේ සම්බන්ධව කැබිනට් පත්‍රිකාවක් කෙටුම්පත් කර අමාත්‍යාංශය වෙත යොමු කරන ලෙසට උපදෙස් ලබාදී ඇත.<br>ඉහත ලිපියේ උපදෙස් පරිදි 2021.06.09 දිනැති අංක: RALL/SEC/LEGAL/MOD/2021(18) මගින් අදාළ කැබිනට් පත්‍රිකා කෙටුම්පත ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමුකර ඇත.2021.06.11 දිනැති අංක: RALL/SEC/LEGAL/MOD/2021(20) දරන ලිපිය මගින් RPML සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය ලෙස සාමාජිකයින් යෝජනා කර අනුමැතිය සඳහා ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමුකර ඇත.අධ්‍යක්ෂක මණ්ඩලයට යෝජනා කර ඇති සාමාජිකයින් සඳහා 2021.06.15 දිනැති අංක: MOD/SD/MA/2021(86) දරන ආරක්ෂක අමාත්‍යාංශය ලිපිය මගින් අනුමැතිය ලබාදී ඇත. සී/ස රක්නා ආරක්ෂක ලංකා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සම්මුති අංක: 14/2021 යටතේ මෙම නව උප සමාගම පිහිටුවීම සඳහා මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. RPML සමාගම 2021.06.21 වන දින 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කර ඇත.<br>2021.07.30 දිනැති 137 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා 137(04) දරන මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කරමින් 2021.06.15 දිනැති අංක: MOD/SD/MA/2021(86) දරන ලිපිය මගින් නව සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය ලෙස යෝජනා කරන ලද සාමාජිකයින් සඳහා ආරක්ෂක අමාත්‍යාංශ අනුමැතිය ලැබී ඇත. 137(04) අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවේ සඳහන් කරුණු සඳහා සී/ස රක්නා ආරක්ෂක ලංකා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාදී ඇත. 2021.10.19 දිනැති අංක: MOD/SD/2021(254) දරන ආරක්ෂක අමාත්‍යාංශ ලිපිය මගින් මෙම නව සමාගම පිහිටුවීමේ | 2021 වර්ෂයේ ලබා දී තිබූ අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගතයුතු වීම. |

| | | |
|---|---|---|
| | අවශ්‍යතාවයක් පවතින්නේද යන්න පිළිබඳව ශක්‍යතා අධ්‍යනයක් කිරිමට උපදෙස් ලබාදී ඇතත් සමාගමේ එවකට සිටි සභාපති/ප්‍රධාන විධායක නිලධාරි ඇතුළු කළමනාකාරිත්වය විසින් ශක්‍යතා අධ්‍යනයක් සිදු නොකිරිම සම්බන්ධයෙන් වත්මන් සභාපති/ප්‍රධාන විධායක නිලධාරි ඇතුළු කළමනාකාරිත්වයට කරුණු දැක්වීමට හැකියාවක් නොමැත. මෙම ප්‍රශ්නගත කාලසීමාව තුළදී රටතුළ දැඩි පොහොර හිඟතාවයක් පැවතිමත් ජාතික අවශ්‍යතාවයක් ලෙස සලකා කාබනික පොහොර නිෂ්පාදනයට ප්‍රමුඛත්වයදී තිබීම හේතුවෙන් එය සපුරාලීමට 2021.06.21 වන දින RPML සමාගම පිහිටුවීමට කටයුතුකර ඇති බව උපකල්පනය කළ හැකි වේ. | |

**3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමට අයත් 9mm Pistol වර්ගයේ ආයුධ 08 ක් සහ SLR වර්ගයේ ආයුධ 11 ක් ඇතුළු ආයුධ 19 ක් ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් පොලිස් විශේෂ කාර්ය බලකා පුහුණු පාසලෙහි මුද්‍රා තබා තිබූ අතර ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව අහෝසි වී ඇති බැවින් ඒ සම්බන්ධයෙන් කටයුතු කිරිමට සමාගමට නොහැකි වී තිබුණි. | එම අවි සමාගම වෙත යලි ලබාගැනීමට ආරක්ෂක අමාත්‍යාංශයේ මැදිහත්වීම යටතේ අවශ්‍ය ඉදිරි කටයුතු නිරන්තරයෙන් සිදුකරමින් පවති. | අවි ආයුධ නිදහස් කරගැනීමට අවශ්‍ය පියවර ගත යුතුවීම. |

**3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 වර්ෂයේ මැයි 20 දින ඉදිකිරීම් ආරම්භ කර තිබූ සමාගමේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල සඳහා නාගරික සංවර්ධන අධිකාරියට අයත් කොළඹ නගරයේ පිහිටි පර්චස් 86.4 ක ඉඩමක් තෝරාගෙන තිබූ අතර ගොඩනැගිල්ල ඉදිකිරීමේ ඇස්තමේන්තු වටිනාකම රු. මිලියන 3192.47 ක් විය. අදාල ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත් සමාගම වෙත රු. මිලියන 681.06 වැඩ සුරක්ෂණ අත්තිකාරම් මුදල් ගෙවා ඉදිකිරීම් යම් ප්‍රමාණයක් සිදුකර 2015 ජූලි 03 දින වන විට ඉදිකිරීම් ඒකපාර්ශිකව නවතා දමා තිබුණි. ඒ වන විට කල වැඩ වටිනාකම රු. මිලියන 424.41 ක් ලෙස උපදේශන සමාගම විසින් ගෙවීම් අනුමත කර තිබූ අතර ප්‍රමාද ගාස්තු, ව්‍යාපෘති නවතා දැමීම වෙනුවෙන් ගෙවීමට ඇති අමතර වියදම්, ආවස්ථික පිරිවැය අලාභය හා ලාභ අහිමිවීම යනාදී වශයෙන් එකතුව රු.මිලියන 1,012 ක් වෙනුවෙන් කොන්ත්‍රාත් සමාගම විසින් හිමිකම් ඉල්ලා ඇති | කොන්ත්‍රාත් සමාගම වෙත වැඩ සුරක්ෂණ අත්තිකාරම් වශයෙන් රු. 608,089,855 ගෙවීම් කර ඇත. නමුත් කළ වැඩ වටිනාකම ලෙස රු. 424,606,569ක් ලෙස උපදේශන සමාගම අනුමතකර ඇති අතර ආවරණය නොකළ වැඩ සඳහා වැඩිපුර රු. 183,683,286 ක් මාගා ඉන්ජිනියරින් පුද්ගලික සමාගම ආයතනයට ගෙවා ඇත. පළමු අදියරේ කොන්ත්‍රාත් සමාගම වෙත ගෙවා ඇති මුලු මුදල රු. 608,089,855ක් වන අතර කළ වැඩ වටිනාකම ලෙස උපදේශන සමාගම අනුමතකර ඇති මුදල රු. 424,606,569 කි. ඒ අනුව වැඩිපුර ගෙවා ඇති මුදල රු. 183,683,286 ක් වේ. එම මුදල හිලව් කිරීමට 2017 පෙබරවාරි 28 දින | ව්‍යාපෘති ආරම්භ කිරීමේදී විධිමත් ක්‍රමවේදයන්ට අනුකූලව එය සිදුකළ යුතු වීම. |

| | | |
|---|---|---|
| අතර ඒ සඳහා උපදේශන සේවා සමාගමේ එකඟතාවය ලැබී ඇති බව තහවුරු නොවුණි. සමාගමට අරමුදල් නොමැතිවීම මත සමාගම විසින් සිදුකල ඉල්ලීමකට අනුව අත්තිකාරම් මුදල අඩුකළ පසු ගෙවීමට ඇති ඉතිරි මුදල වූ රු.මිලියන 330.94 ක මුදල වෙනුවට රු.මිලියන 361.37 ක මුදලක් ලබා නොගැනීමට හා නොගෙවීමට දෙපාර්ශවය එකඟ වී තිබුණි. මෙහිදී අදාල උපදේශක සේවා සමාගම තෝරා ගෙන ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමෙන් මාස 03 කට පසු ගිවිසුම් අත්සන් කර තිබූ අතර උපදේශක සමාගමෙන් ඉටුවිය යුතුව තිබූ උපදේශන කාර්යයන් අපේක්ෂිත පරිදි ඉටුවී නොතිබූ බව නිරීක්ෂණය විය. එසේම ගොඩනැගිලි ඉදිකිරීමේදී ඊට අදාළ විවිධ රාජ්‍ය අංශ වලින් ලබාගත යුතුව තිබූ නිෂ්කාශන වාර්තා ද ලබාගෙන නොතිබූ අතර ඉදිකිරීම් ආරම්භ කිරීමට පෙර ඒ සඳහා අරමුදල් සපයා ගන්නා පැහැදිලි මුදල් ප්‍රවාහයක් නොමැතිව සිදුකර තිබුණි. ඒ අනුව ඉහත ගෙවීම්වලට අමතරව මෙම ඉදිකිරීම සඳහා උපදේශක සමාගමට ගෙවා තිබූ රු.මිලියන 146.71 ක් හා පාංශු තාක්ෂණය (Soil Tech) සඳහා රු. 583,005 ක් ද ඇතුළුව මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් දරා තිබූ එකතුව රු.මිලියන 828. 36 ක වියදම නිෂ්කාර්ය වියදම් විය. | සාකච්ඡාවේදී එකඟවයට පැමිණ ඇත. ඒ අනුව දෙවන අදියර ආරම්භ කිරීමේදී පළමු අදියර වෙනුවෙන් කිසිදු මුදලක් තවදුරටත් ගෙවීමට නොමැති බවට එවකට හිටපු සභාපති/ප්‍රවිනි අත්සනින් යුතුව 2020.08.25 දිනැති අංක: RALL/SEC/LEG/GENERAL/2020 (35) දරන ලිපිය මගින් කොන්ත්‍රාත් සමාගමේ සභාපති වෙත දැනුම්දී ඇත. | |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 මාර්තු 31දිනට සමාගමේ ප්‍රධාන කාර්යාලය ඇතුළු ප්‍රාදේශීය කාර්යාලයන්හි 247 ක්වූ පරිපාලනයට සම්බන්ධ කාර්යය මණ්ඩලය කොන්ත්‍රාත් පදනමින් බඳවාගත් කාර්යය මණ්ඩලය වූ අතර සමාගමේ ස්ථිර පදනමින් සිටිය යුතු තනතුරු හඳුනාගෙන ඒ අනුව බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අප සමාගමේ ප්‍රධාන ව්‍යාපාරික ඒකකයන් වන ගොඩබිම් මෙහෙයුම් අංශයේ සේවයේ නියුතු ආරක්ෂක නිලධාරීන්, විශේෂ නිපුණතා අංශයේ සනීපාරක්ෂක සේවයේ නියුතු අයවලුන් සහ සමුද්‍ර ආරක්ෂක නිලධාරීන් ආදී ව්‍යාපාරයට සෘජුව සම්බන්ධව කටයුතු කරන සේවකයින්, පඩිපාලක සභා ආඥා පනතේ ප්‍රතිපාදනයන්ට යටත්ව සකසන ලද ලද පඩිපාලක සභා යටතේ නියාමනය වන අතර ව්‍යාපාරික ස්වභාවය අනුව කොන්ත්‍රාත් පදනම යටතේ සේවය කරනු ලබයි. එසේම අප සමාගමේ පවතින ව්‍යාපාරික ස්වභාවය අනුව ආයතනයේ 3000කට ආසන්නව සිටින සියලුම සේවකයන් ස්ථිර සේවකයන් කිරීමේ හැකියාවක් නොමැති අතර, ආයතනයේ අවශ්‍යතාවය මත යම් විශේෂිත තනතුරක් ස්ථිර කළ යුතු නම් ඒ සඳහා සාධාරණ ලෙස කරුණු ඉදිරිපත් කර එම තනතුර ස්ථිර කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගැනීමට කටයුතු කරනු ලැබේ. | අනුමත කාර්ය මණ්ඩලය සඳහා සමාගමේ ස්ථිර පදනමින් සිටිය යුතු තනතුරු හඳුනාගෙන අනුමත කාර්යමණ්ඩලය සඳහා අවශ්‍ය බඳවා ගැනීමේ කටයුතු සිදුකළ යුතු වීම. |